# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය
மாகாண பொதுச்சேவை ஆணைக்குழு, கிழக்கு மாகாணம், திருகோணமலை
PROVINCIAL PUBLIC SERVICE COMMISSION, EASTERN PROVINCE, TRINCOMALEE


ඔබේ අංකය / உமது இல / Your No

මගේ අංකය / எனது இல / My No : EP/07/03/01/05/2023

2024.05.03

**නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා**
**ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2023**

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.03.30 දින පවත්වන ලද උක්ත තරග විභාගයේ ප්‍රතිඵල මත ඔබගේ මූලික සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය ද ඉන් අනතුරුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය ද පහත පරිදි පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ.

**Date :** **Board No :**

**Time : 9.30 a.m.** **Seat No :**

**Venue : Provincial Council Secretariat - Eastern Province, Kanniya Road, Varothaya Nagar, Trincomalee.**

සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලියකියවිලිවල **මුල් පිටපත් සහ ඡායා පිටපත්ද** රැගෙන පැමිණෙන ලෙස මෙයින් දන්වා සිටින අතර, නියමිත දිනට ඔබ සම්මුඛ පරීක්ෂණය සඳහා නොපැමිණියහොත් මේ පිළිබඳව පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සලකා බලනු නොලැබේ.

1. අ.පො.ස.(සා.පෙළ) සහතිකය
2. අ.පො.ස.(උ.පෙළ) සහතිකය
3. උපාධි සහතිකය/ඩිප්ලෝමා සහතිකය {උපාධි/ඩිප්ලෝමා සහතිකය, හදාරා ඇති මූලික විෂයයන් ඇතුලත් සහතිකය, හදාරා ඇති සියලුම විෂයන් ඇතුලත් සහතිකය (Transcript)}
4. පදිංචිය සනාථ කිරීම සඳහා 2020,2021,2022 වර්ෂයන් සඳහා ලබාගත් ඡන්ද හිමි නාම ලේඛනයේ සහතික කරන ලද උපුටනය
5. ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳව සහතිකය (මාස 06 ක් තුල ලබාගෙන තිබිය යුතුය.)
6. ජාතික හැඳුනුම්පත/වලංගු විදේශ ගමන් බලපත්‍රය/ වලංගු රියදුරු බලපත්‍රය.
7. උප්පැන්න සහතිකය.
8. චරිත සහතිකයක් (මාස 06 ක් තුල ලබාගෙන තිබිය යුතුය.)
9. අවශ්‍ය විය හැකි වෙනත් සහතික.

**සටහන ඃ- ඉහත සඳහන් කරන ලද සියලුම ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයේදීම ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරන සහතික සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.**

ඔබ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන්නේ නම් පමණක් මෙදිනම ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ද යොමු කරනු ලැබේ. එබැවින් විනාඩි 05 ක පමණ වාචික ඉදිරිපත් කිරීමක් (Oral Presentation) සඳහා ද සූදානම්ව පැමිණෙන මෙන් දන්වමි. (ඔබ විෂයයන් කිහිපයක් සඳහා අයදුම්කර ඇත්නම් ඒ ඒ විෂයයන්ට අදාලව ප්‍රායෝගික පරීක්ෂණයන් සඳහා සූදානම්ව පැමිණෙන ලෙස දන්වා සිටින අතර , සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වාචික ඉදිරිපත් කිරීම සිදුකළ යුත්තේ කුමන විෂයය සඳහා ද යන්න ඔබ වෙත දැනුම් දෙනු ඇත. ඔබ විසින් ඉල්ලා ඇති සහ සම්මුඛ පරීක්ෂණයේදී සළකා බලනු ලබන විෂයයන් www.ep.gov.lk යන වෙබ් අඩවියේ පළකර ඇත.) ඔබගේ ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක ඔබ විසින් සූදානම් කරගෙන පැමිණිය යුතුය.

මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම ඔබට පත්වීමක් ප්‍රදානය කරන බවට සහතිකයක් නොවන බව සැලකුව මැනවි.

**ඒ. මන්සූර්,**
ලේකම්.
ප.රා.සේ.කො.ස. - නැ.ප.


**தொலை பேசி / දුරකතන / Telephone**

அலுவலகம் / කාර්යාලය / Office : 026 2220092
தொலைநகரி / ෆැක්ස් / Fax : 026 2222174
மின்அஞ்சல் / විද්‍යුත් තැපෑල / E-mail : ppsc@ep.gov.lk

கன்னியா வீதி, வரோதயநகர், திருகோணமலை
කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය
Kanniya Road, Varothayanagar, Trincomalee


SAMPLE

සැළකිය යුතුයි :

1. මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන නැගෙනහිර පළාත් සභාවේ සභා ලේකම් කාර්යාල පරිශ්‍රයට පිවිසීමට අවසර දෙනු ලබන්නේ අයදුම්කරුට පමණි.

2. මේ සමග එවනු ලබන සම්මුඛ පරීක්ෂණ අනුපිළිවෙල අංකය පැහැදිලිව පෙනෙන සේ පැළඳ සිටිය යුතුය. එසේම මේ සමග එවා ඇති ආකෘති පත්‍රය නිසියාකාරව සම්පූර්ණ කර රැගෙන ආ යුතුවේ.

3. ඔබ, නැගෙනහිර පළාත් සභාවේ සභා ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ඔබට වෙන් කර ඇති අසුනේ අසුන්ගත යුතු අතර නියමිත වේලාවේදී සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබව කැඳවා ගෙන යනු ඇත.

4. සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේදී සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත් වල මුල් පිටපත් හා ඡායා පිටපත් මෙම කැඳවීම් ලිපියේ දක්වා ඇති අනුපිළිවෙලින් වෙන වෙනම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

5. සම්මුඛ පරීක්ෂණයේදී බඳවාගැනීමේ දැන්වීමට අදාල සුදුසුකම් ඔබ විසින් සනාථ කරන්නේ නම් පමණක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා වන අවසර පත්‍රයක් ඔබ වෙත නිකුත් කරනු ඇත.

SAMPLE